V III. හලාවත දිස්ත්‍රික්කයේ දුම්මලදෙණිය පිහිටා ඇති විශ්වවිද්‍යාලයට අයත් දේපල තමන්ට අයත්බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලමින් එක් පාර්ශ්වයක් විසින් දිස්තික් උසාවියේ නඩුවක් ගොනු කර ඇති අතර එය විභාගවෙමින් පවතී.

IX. වෛද්‍ය පීඨය පිහිටා ඇති රජයේ ඉඩමට සිය අයිතිය ඉදිරිපත් කරමින් පාර්ශ්වයන් කීපයක් විසින් ආරම්භ කරන ලද නෛතික කෘත්‍ය ද විභාග වෙමින් පවතී.

X. විශ්වවිද්‍යාලය මගින් එක් කලින් සිටි ගුරුවරයෙක් ඉවත් කිරීමට විරුද්ධව ඇය විසින් විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ ගොනු කළ අභියාචයක් විභාගවෙමින් පවතී.

XI. විශ්වවිද්‍යාලය මගින් කලින් සිටි ගුරුවරයෙක්ගේ සේවය දීර්ඝ නොකිරීමට විරුද්ධව එම තැනැත්තා විසින් විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ ගොනු කළ නඩුවක් විභාගවෙමින් පවතී.

| **<u>ගෙවිය හැකි ගිණුම්</u>** | **30** | | |
|---|---|---|---|
| තරුණ අරුණ වැඩසටහන | | 2,651,024 | 2,651,024 |
| GELT වැඩසටහන | | 2,434,233 | 2,434,233 |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන | | 590,208 | 411,679 |
| විවිධ තැන්පතු | | 11,168,192 | 9,652,510 |
| මුද්දර තැන්පතු | | 64,200 | 64,200 |
| ගෙවිය හැකි බදු | | 2,117,402 | 2,239,125 |
| අවලංගු චෙක්පත් | | 1,018,865 | 16,970 |
| කාර්යමණ්ඩල ආරක්ෂක තැන්පතු | | 58,806 | 53,795 |
| වෙනත් ගෙවිය හැකි දෑ | | 456,255 | 827,656 |
| වෙනත් | | 4,855 | 4,855 |
| | | **20,564,041** | **18,356,048** |

| උපචිත වියදම් | 31 | | |
|---|---|---|---|
| විගණන ගාස්තු | | 1,564,298 | 970,400 |
| පෞද්ගලික වැටුප් | | 9,559,433 | 10,002,766 |
| ගමන් වියදම් | | 76,077 | 45,918 |
| සැපයුම් වියදම් | | 6,050,443 | 1,993,059 |
| ගබඩා සැපයුම් | | 3,438,945 | 262,149 |
| නඩත්තු වියදම් | | 2,671,437 | 1,823,117 |
| ගිවිසුම්ගත සේවා | | 20,952,328 | 9,403,523 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 12,681,096 | 13,282,886 |
| පර්යේෂණ ගෙවීම් | | 2,968 | - |
| මෙගා හීටර්ස් පෞද්ගලික සමාගම | | 39,200 | - |
| පුස්තකාල පොත් හා වාරසඟරා | | 128,395 | 576,345 |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | | - | 15,114,821 |
| පුනරුත්ථාපන වැඩ | | - | 5,687,732 |
| ලියාපදිංචි ගාස්තු | | 2,300 | - |
| ගාස්තු අයකරන පාඨමාලා | | - | 22,057 |
| | | **57,166,920** | **59,184,773** |

| ආපසු දෙන තැම්පතු | 32 | | |
|---|---|---|---|
| ටෙන්ඩර තැන්පතු | | 1,012,596 | 523,434 |
| ආරක්ෂක තැන්පතු | | 33,014,365 | 28,994,787 |
| පුස්තකාල තැන්පතු | | 277,500 | 50,000 |
| පුනරුත්ථාපන තැන්පතු | | - | 8,471,574 |
| | | **34,304,461** | **38,039,795** |

## මූල්‍ය ප්‍රකාශන සම්න්ධ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන මගින් විශ්වවිද්‍යාලයේ කටයුතු සම්බන්ධව සහ එම කාල පරිච්ඡේදයේ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධව සත්‍යය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් වන බවට සෑහීමකට පත් වන්නේ නම් මිස පාලක සභාව විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත නොකළ යුතු වේ. පාලක සභාව විසින් පහත දැක්වෙන පරිදි කටයුතු කිරීම අවශ්‍ය කෙරේ.

- සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ඒවා අඛණ්ඩව අදාළ කිරීම.
- යුක්ති සහගත සහ ඥානාන්විත තීන්දු ගැනීම සහ ඇස්තමේන්තු කිරීම.

විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පෙන්වීමට සහ පැහැදිලි කිරීමටත් ඕනෑම අවස්ථාවක දී සාධාරන නිවැරදිතාවක් ඇතිව එළිදරව් කිරීමටත් ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා තබා ගැනීම සම්බන්ධව පාලක සභාව වගකිව යුතු වේ.

### පාලක සභාවේ වගකීම් ප්‍රකාශනය

සාමාජිකයන් විසින් සිය උපරිම දැනීමේ හැටියට පහත දැක්වෙන පරිදි තහවුරු කරනු ලබති.

> අදාළ නීතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවටත් ඒවා මගින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳව සත්‍යය හා සාධාරන අදහස් නිරූපණය කරන බවටත්

කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලක සභාව වෙනුවට

මහාචාර්ය සරත් අමුණුගම
උපකුලපති

2012 මැයි 30

## 21. විගණකාධිපති වාර්තාව

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කැලණිය විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2012 මැයි 10 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්

කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ එකතුව රු.214,369,787 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු දැක්වෙන කෙටුම්පත් වාර්තාවක් 2012 මැයි 10 දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. එයින් රු.203,765,950 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර 2012 මැයි 30 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කෙරුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ආපසු නොගෙවිය යුතු පුස්තකාල තැන්පතු රු.10,603,837ක් ආදායම් ලෙස ගිණුම්ගත නොකර ආපසු ගෙවියයුතු තැන්පතු ලෙස දක්වා තිබුණි.

#### 2.2.3 ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් 2 ක රු.333,187ක හර ශේෂ පිළිබඳ පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර ගෙවිය යුතු ගිණුම් 10 ක රු.6,582,289 ක් වූ වර්ෂ 01 සිට 06 දක්වා පැරණි බැර ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. උපකුලපතිවරයාගේ පිළිතුරු අනුව නිවැරදි තොරතුරු සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි ගොනු සකසා ගැනීමට අසීරු වූ බවද, 2012 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කරන විට නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බවද දන්වා තිබුණි.

## 2.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix(5)පරිච්ඡේදය | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන පරිදි නිල නිවාස කුලී තීරණය කල යුතු වුවත් එසේ කටයුතු නොකර නිවාස කමිටුව විසින් කුලිය තීරණය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු.රෙ. 104 (3) (4) | අනතුරක් සිදුවූ විට අදාල පරීක්ෂණ පවත්වා විගණකාධිපතිට වාර්තා කල යුතු වුවත් අනතුරට පත් ත්‍රීරෝද රථයට සහ එහි ප්‍රවාහනය කල රු. 150,000 ක් වටිනා දුමාන යන්ත්‍රයට අලාභ වී තිබුණද ඒ සම්බන්ධව පරීක්ෂණ වාර්තා ඉදිරිපත් නොවිණි. |
| (ඇ) මු.රෙ. 135 (i) | පද්ධතියේ ප්‍රමාණවත් අභ්‍යන්තර පරීක්ෂාවක් ඇතිවන අයුරින් වැඩ බෙදීමක් සිදුකලයුතු වුවත් ගෙවීම් වවුචර්වල අනුමත කිරීම, නිර්දේශ කිරීම, පැමිණීම සහතික කිරීම යනාදී කාර්යයන් කිහිපයක් හෝ සියල්ල එකම නිලධාරියකු විසින් සදුකළ අවස්ථා 13ක් විය (විගණන යොමුව CE/F/KU/2011/B/18)<br>පරීක්ෂාවක් ඇතිවන අයුරින් වැඩ බෙදීම |
| (ඇ) මු.රෙ. 371 (2) (ඇ) | කාර්යය නිමකල විගස, ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 47 කදී ලබාගත් මිශ්‍ර අත්තිකාරම් රු.1,283,788 ක් හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා අවස්ථා 11 කදී ලබාගත් රු.1,579,778 ක් දින 15 සිට 126 දක්වා ප්‍රමාද වී පියවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | මු.රෙ. 395(ඇ) | එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් ශිෂ්‍ය නිවාස ලැබීම් රැස්කිරීමේ ගාස්තු ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (ඊ) | මු.රෙ. 570 (ඇ),<br>මු.රෙ. 571 (1) හා<br>මු.රෙ. 571 (2) (3) | 2011 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 සිට වර්ෂ 6 දක්වා පැරණි රු.17,105,350 ක් වටිනා ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු පැවැති අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. අර්ධ වර්ෂයකට වරක් කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් ලැයිස්තුවක් සකස් කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2006 මාර්තු 01 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 6.3.3 වගන්තිය | විවෘත කරන ලද ලංසු නැවත මුද්‍රා තබා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති වෙත භාරදිය යුතු වුවද තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීමට පෙර එක් නිලධාරියෙකු වෙත ලබාදී නිර්දේශ ලබාගෙන තිබුණි. |
| | (ii) 8.13.4 වගන්තිය | ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් 10% ඉක්මවන මිල වෙනස්වීම් වෙනුවෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතු වුවත් කොන්ත්‍රාත් දෙකක එම මිල වෙනස්වීම් වෙනුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඌ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ Paye/Tax/01/2011 හා 2011 අප්‍රේල් 18 දිනැති චක්‍රලේඛය | නිත්‍ය සේවා නියුක්ති ලාභ වල එකතුව රු. 50,000 ඉක්මවන විට උපයන විට ගෙවීම් බදු අයකල යුතු වුවත් නිත්‍ය සේවා නියුක්ති ලාභ වල එකතුව රු.50,000 ඉක්මවූ කාර්ය මණ්ඩලයෙ නිලධාරීන් වෙනුවෙන් දීමනා ගෙවීමේදී උපයන විට ගෙවීම් බදු අයකරගෙන නොතිබුණි. මාස 03 ක නියැදි පරීක්ෂාවේදී අයකර නොගත් උපයන විට ගෙවීම් බදු මුදල රු. 98,700 කි. |

| | |
|---|---|
| (එ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දිනැති චක්‍රලේඛය - <br> 2.11 ඡේදය | මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු වුවත් රාගම වෛද්‍ය පීඨයේ ධාවන තත්ත්වයේ පවතින වාහන 06 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඒ) අංක 95(2) හා 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය <br> 2 ඡේදය | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් සිය සේවකයින්ට ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව මුදල් අයකර පවත්වන පාඨමාලා වල ආදායමෙන් නිලධාරීන් 07 දෙනෙකු සඳහා රු.252,959 ක දීමනා භාණ්ඩාගාර අනුමැතියක් නොමැතිව ගෙවා තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. |
| (ඔ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 20 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 5.2.1 පරිච්ඡේදය | ඉලක්කයන්ට ළඟා වීම සඳහා වර්ෂය ආරම්භයට පෙර වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරන ආකෘතියට අනුව අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 9.3.1 (i) පරිච්ඡේදය | මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලා සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව තාවකාලික කාර්ය මණ්ඩලය බඳවාගෙන රු. 10,000 සිට රු.21,000 දක්වා නිලධාරීන් 07 දෙනෙකු සඳහා මාසිකව දීමනා ලෙස රු. 85,000 ක් ගෙවා තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. |
| (ඕ) අංක 438 හා 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය <br> 02 (අ) උප වගන්තිය | රාගම වෛද්‍ය පීඨයේ ගබඩා තොග තුළ චලනය නොවන යල්පැනගිය හා අබලි භාණ්ඩ අයිතම 30 ක් නිරීක්ෂණය වන අතර ඒ සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

| | |
|---|---|
| (ග) අංක 45 හා 2011 අප්‍රේල් 02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උප වගන්ති | |
| i. 3(i) උප වගන්තිය | විශ්ව විද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය සහ ඉන් ඉහළ මට්ටමේ ආචාර්යවරුන් වෙත පමණක් පර්යේෂණ දීමනාව ගෙවිය හැකි වුවද සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද ආධුනික කථිකාචාර්යවරුන් හා සෙසු නිලධාරීන් වෙනුවෙන්ද මෙම දීමනාව ගෙවා තිබුණි. |
| ii. 4 (අ) උප වගන්තිය | 2011 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා පර්යේෂණ දීමනා ලබාගැනීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් විසින් පර්යේෂණ සැලැස්මක්, පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගතයුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් 434 දෙනෙකු වෙත චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව රු.53,619,991 ක් පර්යේෂණ දීමනා ලෙස ගෙවීම්කර තිබුණි. |

## 3. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,094,214,786 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,098,722,333ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.1,167,151,527 ක ප්‍රදාන හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය රු.72,936,741 ක් විය. ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.984,910,348 ක ප්‍රදානය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු.113,861,985 ක් දක්වා අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.186,798,726 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට බාහිර විභාග වලින් ලද ආදායම් හා රජයේ ප්‍රදාන රු. 248,661,770 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2009 අගෝස්තු මාසයේදී රු. 23,383,000 ක පිරිවැයක් දරා මිලදීගත් ශ්‍රව්‍ය දෘෂ්‍ය ජාල පද්ධතිය (Audio Visual System) සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 2 1/2 ක කාලයක් ගතවී ඇතත් අපේක්ෂිත කාර්ය සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

ආ. සුදුසුකම්ලත් විදුලි ඉංජිනේරුවකු විසින් විශ්වවිද්‍යාලයට අවශ්‍ය විදුලි ඉල්ලුම් ධාරිතාවය තීරණය කර නොතිබූ අතර එවැනි නිර්දේශයක් නොමැතිව අභ්‍යන්තර විදුලි දිගු කිරීම් සිදුකිරීම නිසා දිගු කාලයක සිට වරින්වර විදුලිය බිඳ වැටීම් සිදුවන බව නිරීක්ෂණය විය.

### 4.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2007 වර්ෂයේ සිට 2011 දෙසැම්බර් දක්වා පර්යේෂණ 06ක් සඳහා රු.1,129,425ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර රු.601,219 ක් වැය කර රු. 528,206 ක් ගිණුම් වල ඉතිරිව පැවතුණි.

(ආ) ජංගම හා රැස්කිරීමේ ගිණුම් 08ක රු.මිලියන 115 ක් වර්ෂය පුරා අතිරික්තව පැවති අතර, මෙම මුදල් වාර්ෂිකව 6% ක ඉතිරිකිරීමේ ගිණුමක හෝ කෙටිකාලීන වෙනත් ආයෝජනයක යෙදවූයේ නම් රු. 4,599,473 ක ආදායමක් ලබාගත හැකිව තිබුණි.

### 4.3 හඳුනාගන්නා ලද පාඩු

වාර්ෂික තොග සමීක්ෂණයේදී කැලණිය හා රාගම පරිශ්‍ර වල ප්‍රධාන හා නඩත්තු ගබඩාවල, වටිනාකම රු. 448,175 ක් වූ භාණ්ඩ අයිතම 78 ක තොග ඌනතාවයක් නිරීක්ෂණය වී තිබුණි. මෙම ඌනතාවයන් සඳහා හේතු අනාවරණය නොවූ අතර ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

### 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

#### 4.4.1 කොන්ත්‍රාත් පරිපාලනය

ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 ක ගිවිසුම් ගත පිරිවැය රු. 258,184,732 ක් වුවද 2011 දෙසැම්බර් 31 දින වන විට රු. 418,875,992 ක් ගෙවීම්කර තිබූ හෙයින් ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා ගෙවීම්කර තිබූ මුදල රු.160,691,260 කි.මෙම කොන්ත්‍රාත් 06 න් දෙකක් නිම කිරීමට වර්ෂ 1 1/2 බැගින්ද එක් කොන්ත්‍රාත්තුවක් වර්ෂයකින්ද ප්‍රමාද වී තිබුණ. කොන්ත්‍රාත්තු ගිවිසුමේ අංක 49 (1) ඡේදය ප්‍රකාරව ප්‍රමාද වී තිබූ කාලය සඳහා අයකල යුතු රු.14,034,750 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

4.4.2 <u>බාහිර පාර්ශ්වයන්ගෙන් සේවා ලබා ගැනීම.</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ. විශ්වවිද්‍යාලයේ ටෙන්ඩර් කොන්දේසවල 08 වන ඡේදයට අනුව ගිවිසුම් අත්සන් කිරීමට පෙර ඇප මුදල් තැන්පත් කලයුතු වුවද, ගිවිසුමේ කාලය මාස 06 ක් ඉක්මවූ පසු ඇප තැන්පත්කල අවස්ථා 2 ක් නිරීක්ෂණය වන අතර එම ඇපවල වටිනාකම රු.30,000 කි.

ආ. සේවා සැපයුම්කරුවන් සමඟ සේවා කාලය ආරම්භයේදී ගිවිසුම්වලට එළඹිය යුතු වුවද, සැපයුම්කරුවන් 14 දෙනෙකු සමඟ ගිවිසුම් වලට එළඹෙනවිට සේවා කාලයෙන් මාස 03 සිට මාස 09 දක්වා කල් පමාකර තිබුණි.

ඇ. ගිවිසුමට අනුව සෑම මසකම 05 වන දිනට පෙර නියම කරනු ලබන මාසික කුලිය ගෙවිය යුතු වන අතර එසේ නොගෙවන සෑම මාසයක් සඳහාම අධිභාර අයකල යුතු වුවද, සැපයුම්කරුවන් 08 දෙනෙකුගෙන් රු. 4,275 ක අධිභාර සහ හිඟ කුලිය රු. 46,750 ක් අයකර ගෙන නොතිබුණි.

4.5 <u>පුස්තකාල පරිපාලනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ. ප්‍රධාන පුස්තකාලයේ පොත් සමීක්ෂණය අවසන් වරට 2002 වර්ෂයේදී සිදුකර තිබූ අතර එම සමීක්ෂණයේ සට මේ දක්වා වසර 8 ක් ඉක්මවී තිබුණද පොත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

ආ. 2000 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා ආචාර්යවරුන් 76 දෙනෙකුට බැහැර දුන් එහෙත් ආපසු භාර නොදුන් පොත් සංඛ්‍යාව 211 ක් වන අතර එම පොත්වල වටිනාකම රු. 360,267 ක් විය. එම පොත් අතර එක පිටපත බැගින් පුස්තකාලය සතුව තිබූ රු.29,487 ක් වටිනා පොත් 03 ක් එක් ආචාර්යවරයෙක් හා රු.30,462 ක් වටිනා පොත් 02 ක් ආචාර්යවරු දෙදෙනෙකු බැහැර ගෙන ගොස් ආපසු භාරදී නොතිබුණි.

ඇ. ප්‍රධාන පුස්තකාලයේ සවිකර ඇති ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) 2010 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියා විරහිතව තිබුණි. එය අලුත්වැඩියා කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබූ බැවින් පුස්තකාලයේ පොත්වල ආරක්ෂාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

ඈ. රාගම වෛද්‍ය පීඨ පුස්තකාලයේ බැහැර දී වසර 1 සිට 5 දක්වා කාලයක් ගතවී ඇති රු.35,832 ක් වටිනා පුස්තකාල පොත් 09 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආපසු ලබා ගැනීමට හෝ අලාභ අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ වැඩසටහන් අයවැය ලේඛනයේ වියදම් අයිතම 03ක තථ්‍ය වියදම 10% කින් අයවැයගත වියදම ඉක්මවා තිබු අතර එක් වියදම් අයිතමයක අයවැය ගත වියදමට වඩා තථ්‍ය වියදම 40% කින් අඩුවී තිබුණි. පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් සඳහා වියදම ඇස්තමේන්තු කර නොතිබු අතර තථ්‍ය වියදම රු.17,030,527ක් විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) විවිධ අත්තිකාරම්
(ඇ) පුස්තකාල පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) නේවාසිකාගාර පරිපාලනය
(ඊ) වාහන උපයෝජනය
(උ) නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්
(ඌ) ස්ථාවර වත්කම් පාලනය
(එ) නිල නිවාස පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

# 22. විගණන කමිටු වාර්තාව

## විගණන කමිටුවේ සංයුතිය

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2011 වසරේ දී පහත සඳහන් සාමාජිකයන් විගණන කමිටු කාර්යන්හි නියුක්ත වූහ.

| **සාමාජික** | **2011 වසරේ දී කමිටුවට සහභාගීවීම** (සහභාගීවීම/සහභාගීවීමට නියමිත) |
|---|---|
| 1. හරිස්චන්ද්‍ර වාසලතන්ත්‍රි මහතා (සභාපති) | 4/4 |
| 2. ආචාර්ය ආර්. බී. ඒකනායක මහතා | 4/4 |
| 3. එල්. ජේ. පැට්‍රික් අලෙක්සිස් සිල්වා මහතා | 4/4 |

ඉහත සඳහන් සාමාජිකයන්ට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ට ද නිරීක්ෂකයන් ලෙස සහභාගීවීම සඳහා ආරාධනා කරන ලදී.

**රැස්වීම්**

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/31 අනුව වසරකට සිව් වතාවක්වත් කමිටුව රැස්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ කමිටුව සිව් වරක් රැස් වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටු වාර්තා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා දෙන ලදී.

**මූලික වගකීම්**

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතු ඵලදායී ලෙස කර ගෙනයාම සඳහා පාලක සභාවට සහායවීමයි. මූලික වගකීම්වලට පහත දැක්වෙන දෑ ඇතුලත් වේ.

(i) මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
(ii) විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතුවලට අදාළ ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.
(iii) අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන් අධීක්ෂණය කිරීම.
(iv) බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ෂණය කිරීම සහ නිර්දේශයන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදු කිරීම.
(v) අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායී ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
(vi) වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් අනුමත කිරීම.

**වසර තුළ ක්‍රියාකාරකම්**

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

**1) අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.**

2011 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන කමිටුව විසින් අනුමත කර වසර මුළුල්ලේම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාව, විමසුම්වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය සහ අධීක්ෂණය කළේය.

**2) නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම.**
අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලතාවය සහ පාරිතෝෂික ගෙවීම් සහ අර්ථසාධක අරමුදල් ශේෂ නිදහස් කිරීම වැනි ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීමේ තත්ත්වය පිළිබඳ බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සමාලොචනය කරන ලදී.

ප්‍රමාද වී තිබූ අර්ථ සාධක අරමුදල් ශේෂවල ප්‍රගතිය තහවුරු කර ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අර්ථ සාධක අරමුදල් ශේෂ නිදහස් කිරීමේ ක්‍රමය පිළිබඳව කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

**3) ගිවිසුම් කඩ කිරීම් අවස්ථා අඛණ්ඩ සමාලෝචනය සහ අධීක්ෂණය**
කමිටුව විසින් ගිවිසුම් කඩ කළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් මුදල් ආපසු අය කර ගැනීමේ ක්‍රියාවලියේ තත්ත්වය අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කරන ලදී. මෙම ක්‍රියාවලිය හේතුවෙන් ගිවිසුම් කඩ කළ තැනැත්තන් හතර දෙනෙක්ගෙන් මුළු බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට හැකිවිය. ගිවිසුම් කඩ කළ තැනැත්තන් තිදෙනෙක් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලේ ඇති මුදල අඩු කර ගැනීමට කැමැත්ත පළ කිරීමෙන් පසු ඉතිරි මුදල ගෙවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයට අර්ථසාධක අරමුදලේ ශේෂය ලැබුනු පසු සියලු මුදල් පියවෙනු ඇත. තවත් ගිවිසුම් කඩ කළ තැනැත්තන් හතර දෙනෙක් වාරික වශයෙන් ගෙවීම් කරනු ලබන අතර ගෙවීම් පැහැර හරින ලද සාමාජිකයන් හතර දෙනෙකුගෙන් මුදල් අය කර ගැනීම සඳහා ඔවුන්ට එරෙහිව තවදුරටත් නීතිමය පියවර ගෙන ඇත.

**4) අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම.**
මූල්‍ය වාර්තාකරණය සහ විශ්වවිද්‍යාලයේ වාහන පරිපාලනය (වෛද්‍ය පීඨය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.), කොන්ත්‍රාත් පරිපාලනය, විශ්වවිද්‍යාල ආපනශාලා සහ වෙළඳ සැල් නඩත්තුව, ප්‍රාග්ධන භාණ්ඩ මිලට ගැනීම, පුස්තකාල පොත් ණයට දීම, වාර්ෂික ගබඩා සමීක්ෂණ හා බඩු වට්ටෝරු සමීක්ෂණ පැවැත්වීම, නොපිය වූ අත්තිකාරම් අය කර ගැනීම ආදී වෙනත් ඒ හා සම්බන්ධ ප්‍රධාන කාර්යයන්වල ඵලදායීත්වය සමාලෝචනය කළ අතර අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදී.

**5) විගණන කමිටු රැස්වීම්**
2011 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වර්ෂයේ දී විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් ආරාධිත නිරීක්ෂකයෙක් ලෙස සෑම රැස්වීමකමට සහභාගී විය. කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ අනෙක් කාර්ය මණ්ඩල සාමාජිකයන් සහභාගීවිය යුතු බවට අවශ්‍ය කළ අවස්ථාවල දී ඔවුන්ට රැස්වීම්වලට සහභාගීවීම සඳහා ආරාධනා කරන ලදී. ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

**නිගමනය**
විශ්වවිද්‍යාලයේ සමාලෝචිත අභ්‍යන්තර පාලනවල ඵලදායිතාව සම්බන්ධයෙන් සහ 2011 වසර තුළ කමිටුව විසින් සලකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබා දෙන ලද නිර්දේශ මත පසු විපරම් කටයුතු සිදු කිරීම පිළිබඳවත් කමිටුව සෑහීමකට පත්වේ.

සභාපති
විගණන කමිටුව
කැළණිය විශ්වවිද්‍යාලය

## 23. විගණනය පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණය

**කැලණිය විශ්වවිද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ඔබගේ සමාංක හා 2011.08.20 දින දරණ ලිපිය සමඟ ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ගිණුම් පිළිබඳව විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්ති ප්‍රකාර වූ වාර්තාව පිළිබඳව විශ්වවිද්‍යාල පනතේ 108(3) වගන්තිය ප්‍රකාර වූ පහත සඳහන් නිරීක්ෂණ 2012.10.16 දින දරණ 396 වැනි පාලක සභාව විසින් සලකා බලන ලදුව ඔබ වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

1.3. විගණකගේ වගකීම

1.4. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

2. මූල්‍ය ප්‍රකාශන

2.1. තත්ත්වාගණනය කළ මතය

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2.2.2. **ගිණුම්කරණ අඩුපාඩු.**

පුස්තකාල තැන්පතු.

රු.10,603,837/-ක මුදල විශ්වවිද්‍යාලයේ 2010.11.09 දින පැවැති 374 වෙනි පාලක සභාව විසින් අනුමත කර ඇති පාඨමාලා නිර්ණායකයන්ට අනුව පාඨමාලා ගාස්තු සමඟ ශිෂ්‍යයින්ගෙන් අයකර ගනු ලබන පුස්තකාල තැන්පතු මුදල පීඨ පුසතකාලවල හා ප්‍රධාන පුස්තකාලයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පසුගිය කාලපරිච්ජේදය තුළ භාවිතයට ගෙන ඇති අතර එවැනි කටයුතු සඳහා මෙම මුදල් වෙන්කර තබන ලෙස තීරණය කර ඇති බැවින් විශ්වවිද්‍යාල ආදායමක් ලෙසට ගිණුම්ගත නොකොට වෙනම ගිණුමක තැන්පතුවක් ලෙස දක්වා ඇත. කෙසේ වුවද මේ සම්බන්ධව ඉදිරියේදී පාලක සභාවේ අවධානයට යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

2.2.3. **ගෙවිය යුතු ගිණුම්**

(1). ගෙවිය යුතු ගිණුම් 2 ක රු.333,187.00 ක හරශේෂ පිළිබඳව පරීක්ෂාකිරීම් නැවත සිදු කරනු ලබන අතර අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කිරීම් කිරීමට කටයුතු යොදා ඇත.

(11). ගෙවිය යුතු ගිණුම් 10 ක ශේෂයන් පිළිබඳව පරීක්ෂා කිරීම් සිදුකර ඇත.

(අ). ගෙවිය යුතු චෙක්පත් තැන්පත් වෛද්‍ය පීඨය - රු.668,897.00 - මෙම ශේෂය අතුරින් ගෙවිය යුතු යැයි නිශ්චිතවම හඳුනාගත් ශේෂ හැර සෙසු ශේෂයන් 2012 වර්ෂයේදී ආදායමට මාරු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

(ආ). කාර්ය මණ්ඩල තැන්පත් - වෛද්‍ය පීඨය - රු.111,621.00- වර්ෂ 05 කට වඩා පැරණි මෙම ශේෂය පිළිබඳ විස්තර නොමැති අතර තවදුරටත් පරීක්ෂා කර බලා 2012 වර්ෂයේ දී ආදායමට ගැලපීමට කටයුතු යොදා ඇත.

( ඇ). රඳවාගැනීම් බදු (බාහිර විභාග) රු.115,229.00 - මෙම ශේෂය 2010 සිට පැවත එන අතර අදාළ ගැලපීම් 2012 වර්ෂයේදී සිදු කෙරේ.

(ඈ). බාහිර පාඨමාලාවලින් පරිපාලන වියදම් සඳහා තැන්පත් - රු.515,213.00 මෙම ශේෂය ආදායමට ගැලපීමට 2012 වර්ෂයේදී කටයුතු යොදා ඇත.

(ඉ). වෛද්‍ය රක්ෂණ ප්‍රතිපූර්ණය - රු.60,345/- මෙම ශේෂය 2012 වර්ෂයේ දී ආදායමට මාරුකිරීමට කටයුතු යොදා ඇත.

(ඊ). ගෙවිය යුතු අර්ථසාධක, සේවා නියුක්ති භාර අරමුදල, විශ්‍රාම වැටුප්, ආරක්ෂක අරමුදල් වල ශේෂයන් පරීක්ෂා කර අවශ්‍ය නිවැරදි කිරීම් සදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (උ). | තරුණ අරුණ ව්‍යාපෘතිය | - රු.2,651,024 | විශේෂ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලද මුදල් බැවින් තවදුරටත් රඳවාගෙන ඇත. |
| (ඌ). | ගෙල්ට් ව්‍යාපෘතිය | - රු.2,434,233 | |
| (එ). | වෙනත් | - රු. 4,855.00 - | ආදායමට මාරුකිරීමට කටයුතු යොදා ඇත. |

2.2.4. <u>**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**</u>

| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ)** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 135 (ඇ) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix(5) පරිච්ඡේදය | නිවාස කමිටුව විසින් නිවාස කුලිය තීරණය කර තිබුණේ රජයේ නිවාසවලට අදාළව ආයතන සංග්‍රහයේ x1x පරිච්ඡේදයේ 5:2:4 වගන්ති ප්‍රකාරව පාලක සභාව මගින් ලබාගත් අනුමැතිය පරිදිය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු.රෙ.104(3) (4) | අනතුරට පත් වෛද්‍ය පීඨ ත්‍රිවිල් රථය සම්බන්ධයෙන් පොලිසිය විසින් ගම්පහ උසාවියේ නඩුවක් ගොනුකර ඇති අතර, මේ වනවිට නඩු වාර දෙකක් අවසන් වී ඇත. ජාතික රක්ෂණ භාරකාර අරමුදලේ නිලධාරීන් ත්‍රිවිල් රථය පරීක්ෂා කර ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව ත්‍රිවිල් රථය අලුත්වැඩියාව සඳහා යොමු කර ඇත. ත්‍රිවිල් රථයේ ගමන් ගත් විශ්වවිද්‍යාල නිලධාරීන් හා ප්‍රවාහනය කරන ලද දුමාන යන්ත්‍රයට වන්දි ලබාගැනීම සම්බන්ධව නඩුව අවසානයේ දී තීරණය ලබාදෙනු ඇත. මෙම වාහන අනතුර පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| (ඇ). මු.රෙ.135(i) | අත්‍යාවශ්‍ය අවස්ථාවන්වලදී මෙවැනි දෑ සිදුවිය හැකි වුවත් ඉදිරියේදී මෙවැනි දෝෂ අවම කර ගැනීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ඈ). මු.රෙ.371(2) (ඇ) | පෙර වර්ෂවලට සාපේක්ෂව අත්තිකාරම් පියවීම බොහෝදුරට මෙම වර්ෂයේදී කාර්යක්ෂමවී ඇත. ඉතිරි අඩුපාඩු ඉදිරියේදී අවම කර ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ඉ). මු.රෙ.395 (ඇ) | අදාළ ගිණුම් බැංකු සැසදුම් ප්‍රකාශය මේ වනවිට විගණනය සඳහා ලබා දී ඇත. වර්තමානයේදී මෙම බැංකු සැසදුම් නියමිත දිනට සකස් කරනු ලැබේ. |
| (ඊ). මු.රෙ.570 (ඇ),<br>මු.රෙ.571(1) ,<br>මු.රෙ.571 (2),(3) | 2011.12.31 දිනට ගිණුම් පියවීමට පෙර එනම් 2011.08.19 දින අදාළ අංශවලින් කරන ලද විමසුම්වලට අනුව රු.17,105,350.82 ක තැන්පතු තවදුරටත් රඳවාගන්නා ලෙස දැනුම් දී ඇති හෙයින්, එම ප්‍රමාණය හැර අනෙකුත් තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර ඇත. මේ වනවිට මාස 06 කට වරක් කල් ඉකුත් වූ තැන්පතු ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබේ. |
| (උ). 2006 මාර්තු 01 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>i. 6.3.3 වගන්තිය | සමහර අවස්ථාවලදී තාක්ෂණික කමිටුවට පෙර ඒ භාණ්ඩ පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති අයෙකුගෙන් නිර්දේශ ලබා ගැනීමට සදුවේ. උදා: රසායන ද්‍රව්‍ය, විද්‍යා උපකරණ, පරිගණක වැනි දෑ. එවැනි<br><br>අවස්ථාවල තාක්ෂණික නිලධාරියා වෙත යොමු කිරීමෙන් අනතුරුව තාක්ෂණික කමිටුවට ඉදිරිපත් කරනු ලබයි. |
| ii.8:13:4 වගන්තිය | මේ යටතේ සඳහන්ව ඇති කොන්ත්‍රාත් දෙක සම්බන්ධව විස්තර පහත පරිදි වේ.<br><br><u>හෙට්ටියාවත්ත ශිෂ්‍ය නේවාසිකාගාර</u> <u>ගොඩනැගිල්ල.</u><br><br>2008.04.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම මගින් ඉහත කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුව රු.මිලියන 75 - 160 දක්වා ප්‍රතිශෝධනය කර ඇත. ඒ අනුව අනුමැතිය ලබාදී ඇති බැවින් ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා නොමැති බව පෙන්වා දෙමි. |

| | |
|---|---|
| | 1. <u>නව ආපනශාලා ගොඩනැගිල්ල.</u><br>මෙහි අවසන් බිල්පත් මෙතෙක් ඉදිරිපත් වී නොමැති බැවින් ඇස්තමේන්තු වටිනාකම ඉක්මවා ඇති බවට නිශ්චිතව නිගමනය කළ නොහැක. |
| (ඌ).දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ Paye/Tax/01/2011 හා 2011 අප්‍රේල් 18 දිනැති චක්‍රලේඛය | මේ වනවිට හිඟ බදු මුදල් ගණනය කිරීම සිදු කරනු ලබන අතර, අදාළ හිඟ බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉක්මණින් යැවීමට කටයුතු කරනු ලැබේ. |
| (එ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41/90 හා 1990 ඔක්තෝම්බර් 10 දිනැති චක්‍රලේඛය - 2.11 ඡේදය | අංක NA-5949, PB-5195, NB-2585, 61-5088, 61-5671, 50-5173 දරණ වාහනවල ඉන්ධන පරීක්ෂාකර වාර්තා ලබාගෙන ඇති අතර<br><br>202-0892, 63-2954, 30-9624 දරණ වාහන මේ වනවිට අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති බැවින් එම අළුත්වැඩියාවන්ගෙන් පසු ඒවායේද ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාවට යොමු කිරීමට නියමිතව ඇත. |
| (ඒ). අංක 95(2) හා 1994 ජූනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය<br><br>2 ඡේදය | විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා මුදල් උපයන පාඨමාලාවලින් ඉටුවන කාර්යභාරය ඉතා ඉහළ මට්ටමක පවතී. මෙම පාඨමාලාවලට අදාළ රාජකාරි කටයුතු දැනට සිටින කාර්ය මණ්ඩලය ලවාම ඉටුකරවා ගැනීමට සිදුවී ඇත. එබැවින් මෙම පාඨමාලා ඔවුන්ගේ රාජකාරිවලට පරිබාහිරව කෙරෙන කටයුත්තක් නිසාත්, මේ සම්බන්ධයෙන් ඔවුන්ට අමතර සේවාවන් සිදුකිරීමට සිදුව ඇති නිසාත්, ඔවුන් දිරිමත් කිරීමේ අරමුණෙන් විශ්වවිද්‍යාල මුදල් කමිටුව හා පාලක සභාවේ අනුමැතිය මත සකස් කරගත් නිර්ණායක පදනම් කරගෙන මෙම දීමනා ගෙවීම් කරනු ලැබේ. මෙම ගෙවීම තුළින් බාහිර පාඨමාලාවල කටයුතු විධිමත්ව කරගෙන යාමට හැකියාව ලැබී ඇත. |
| (ඔ). අංක පීඊඩී/12 හා 2003 ජූනි 20 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂික අයවැය ලේඛන සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සෑම වර්ෂයකදීම නිකුත් කරනු ලබන මූල්‍ය චක්‍රලේඛයන්ට හා ආකෘතින්ට අනුව අයවැය ලේඛන |

| | |
|---|---|
| i. 5.2.1. පරිච්ඡේදය | පිළියෙල කර අනුමත කරවාගෙන ඇත. කෙසේ වෙතත් වාර්ෂික ගිණුම් ඉදිරිපත් කරන ආකෘතියට අනුව අයවැය ලේඛනය 2012 .11.01 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.. |
| ii. 9.3.1(i) පරිච්ඡේදය | වැඩ අධික බාහිර පාඨමාලාවල කටයුතු ස්ථිර කාර්ය මණ්ඩලයේ අය ලවා ඉටුකරවා ගැනීමට අපහසු අවස්ථාවල පාඨමාලාවල ආදායමෙන් ගෙවීම් කිරීම සඳහා මුදල් කමිටුව හා පාලක සභාවේ අනුමත අයවැය පදනම් කරගෙන ලිපිකාර කටයුතු සඳහා මොවුන් සේවයේ යොදවාගෙන ඇත. ඒ ඒ පාඨමාලාවල ආදායම හා කාර්ය භාරය පදනම් කරගෙන ඔවුන්ට කරනු ලබන ගෙවීම් තීරණය කර ඇත. |
| (ඕ). අංක 438 හා 2009 නොවැම්බර් 13 දිනැති රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය<br>02 (අ) උප වගන්තිය | රාගම වෛද්‍ය පීඨ ගබඩාවේ ඇති චලනය නොවන හා යල් පැන ගිය අබලි භාණ්ඩ අයිතම 2012 වර්ෂයේ දී තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ග). අංක 45 හා 2011 අප්‍රේල් 02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපවගන්තිය.<br>i. 3(i) උප වගන්තිය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011.07.11 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 11/2011 සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2011.05.12 දිනැති ලිපිය ප්‍රකාරව මෙම දීමනාව ගෙවා ඇත. |
| iii. 4 (අ) උප වගන්තිය | අංක 45 හා 2011 අප්‍රේල් 02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ඒ ඒ පීඨවල ආචාර්යවරුන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ සම්බන්ධයෙන් පීඨය විසින් පත් කරනු ලැබූ කමිටු මගින් ඇගයීමකට ලක් කර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා වෙත මෙම ගෙවීම් සිදු කර ඇත. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1. **මූල්‍ය ප්‍රතිඵල.**

4. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

4.1. **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

(අ). අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය ජාල පද්ධතියට අයත් උපකරණ පිඨ මට්ටමින් සවිකොට එම උපකරණ භාවිත කොට බාහිර උපාධි සඳහා ලියාපදිංචි වී සිටින විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු විධිමත් කිරීමට යෝග්‍ය වන පරිදි අදාළ සම්මන්ත්‍රණ සහ දේශන විකාශනය කිරීමට මේ වනවිට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත.

(ආ). විශ්වවිද්‍යාල පද්ධතියට නව ගොඩනැගිලි එකතු වීමේදී එහි ධාරිතාවය හා විදුලි පරිපථ පිළිබඳ වාර්තාවක් සුදුසුකම් ලත් විදුලි ඉංජිනේරුවරයෙකු මගින් ලබාගනී. නමුත් පවතින පැරණි ගොඩනැගිලිවලට අලුතින් විදුලි උපාංග එකතු කිරීමේදී මෙවැනි තත්ත්වයක් ඇති විය හැක. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ විදුලි ධාරිතාවයන් පිළිබඳ ඇගයීමක් සිදුකිරීමට මොරටුව විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරුවරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

4.2. **<u>අරමුදල් ඌන උපයෝජනය.</u>**

(අ). ඡේදයේ දක්වා ඇති පර්යේෂණ 06 සඳහා අනුමත මුදල රු.1,128,750/-ක් වන අතර 2012.09.18 දින වනවිට එයින් රු.623,699.30 ක මුදලක් පර්යේෂණ ව්‍යාපෘති සඳහා උපයෝජනය කර ඇත.

ඉහත පර්යේෂණ ව්‍යාපෘති 06 න් 04 ක් නිමකර අවසන් වාර්තා ඉදිරිපත් කර ඇත. ඉතිරි පර්යේෂණ හවතුන් දෙදෙනා ඉදිරියේදී මුදල් උපයෝජනය කරමින් පර්යේෂණ නිම කරනු ඇතැයි අපේක්ෂිතය.

(ආ). ජංගම ගිණුම්වල අතිරික්තව පවතින මුදල් කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කිරීම වරින් වර සිදුකර ඇත. දක්වා ඇති ජංගම ගිණුම්වල අතිරික්ත මුදල් පිළිබඳව යළි පරීක්ෂා කර බලා ඉදිරියේදි ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

4.3. **<u>හඳුනාගන්නා ලද පාඩු</u>**

මෙයට හේතු වී ඇත්තේ මෘදුකාංග පද්ධතියේ පැවති දෝෂ සහගත තත්ත්වය හා එක සමාන භාණ්ඩ මාරු වී නිකුත් කිරීමයි. මෙම වැරදි නිවැරදි කර ගැනීම සඳහා 2012 වර්ෂයේ නව මෘදුකාංග පද්ධතියක් පරිගණක අංශය මගින් ලබා දී ඇත. ගබඩා ද්‍රව්‍ය නිකුත් කිරීමේදී භාණ්ඩ මාරුවීම් ඇති නොවන ලෙස කටයුතු කිරීමට ගබඩාවලට උපදෙස් ලබා දි ඇත.

4.4. <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.</u>

4.4.1. **කොන්ත්‍රාත් පරිපාලනය.**

2011 දෙසැම්බර් 31 දින වන විට සඳහන් කරන ලද කොන්ත්‍රාත් 06 න් 03 ක පමණ ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා තිබූ අතර එය රු.2,639,556/-ක් පමණි. නිම කිරීමට ප්‍රමාද වූ එක් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් රු.12,931,956/-ක ප්‍රමාද ගාස්තු අවසන් බිල්පත්වලින් අඩුකිරීමට පියවර ගෙන ඇත. අනෙක් කොන්ත්‍රාත්තුවේ ප්‍රමාද කාලය මාස 02 දින 15 ක් පමණක් වන අතර ඒ සඳහා ප්‍රමාද ගාස්තු ඉදිරියේදී අවසන් බිල්පත ලැබුණු පසු අඩුකිරීමට සටහන් කරගෙන ඇත.

4.4.2. **බාහිර පාර්ශ්වයන්ගෙන් සේවා ලබා ගැනීම.**

(අ). මේ වනවිට එම කොන්ත්‍රාත්කරුවන් අදාළ ගිවිසුම් වලට එළඹී ඇති අතර ඇප මුදල් හා හිඟ මාසික කුලී විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත.

(ආ). 2011.04.01 දිනැති ලිපිය මගින් ඇප මුදල් තැන්පත් නොකල සියලු කොන්ත්‍රාත්කරුවන් වෙත ඇප මුදල් තැන්පත් කරන ලෙසත් හිඟ මාසික කුලී ගෙවන ලෙසත් ඇප මුදල් තැන්පත් කිරීමෙන් අනතුරුව 2011.04.8 දින ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙසත් දන්වා යවන ලද අතර මේ වනවිට සියලු කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් වලට එළඹී ඇත.

(ඇ). නියමිත දිනයන්හි දී මාසික කුලී ගෙවීම් කර නොතිබූ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් සිහිකැඳවීමේ ලිපි මගින් දැනුම් දී ඇති අතර අදාළ අයකර ගැනීම් ටෙන්ඩර් කාලය අවසානයේදී ආරක්ෂක තැන්පතු නිදහස් කර ගැනීමේදී අධිභාරය ද සමඟ අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

4.5. **පුස්තකාල පරිපාලනය.**

අ. මේ වනවිට පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව පරිගණකගත කිරීමේ කාර්යාවලිය 95%ක් පමණ අවසන් කර ඇත. ග්‍රන්ථ සංගණන කටයුතු 2012 සැප්තැම්බර් මස දෙවන සතියේ සිට ආරම්භ කර ඇත.

ආ. මේ පොත්වලට අදාළ මුදල් 2012 ජූලි මස සිට අදාළ ආචාර්ය භවතුන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.

ඇ. මේ කැමරා පද්ධතිය (CCTV) අලුත්වැඩියා කිරීමට හෝ වෙනත් වානිජ වශයෙන් ලංකාවේ ක්‍රියාත්මක වන තාක්ෂණික සැපයුම්කරුවන් ලවා අලුතින් කොටස් යොදවා භාවිතා කිරීමට සැළැස්වීමටත් ඇති හැකියාව පසුගිය කාලය පුරාම සොයා බැලූ නමුත් එය ප්‍රායෝගික නොවන බව සනාථ වූ නිසා 2012.09.05 දින පවත්වන ලද තාක්ෂණික කමිටුව (Technical Committee) මගින් එම පද්ධතිය භාවිතයෙන් ඉවත් කර ඒ වෙනුවට නව ගොඩනැගිල්ල ද ආවරණය වන පරිදි අලුතින් පද්ධතියක් සවි කිරීමට දැනට සැලසුම් කර ඇත.

ඇ. මේ පොත් 09 න් එක් පොතක් දැනටමත් ආපසු භාර දී ඇත. තවත් පොත් දෙකක් සඳහා අර්ථසාධක අරමුදලෙන් මුදල් අයකිරීමට කටයුතු යොදා ඇත. වර්ෂ 5 කට වඩා ලඟ තබාගත් පොත් සඳහා විශ්වවිද්‍යාලය මගින් අනුගමනය කරන ප්‍රතිපත්තිය පරිදි පොත් 3 ක් සඳහා මේ වර්ෂය අවසානයේදී වැටුපෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමටත්, ඉතිරි පොත් 3 සඳහා අදාළ කාලය සපිරුණු පසු වැටුපෙන් මුදල් අය කිරීමටත්, එතෙක් එම ආචාර්යවරුන්ට සිහි කැඳවීම් ලිපි යැවීමටත් කටයුතු කර ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1. අයවැය ලේඛනමය පාලනය

වර්ෂය ආරම්භ වීමෙන් අනතුරුව අනුමත වන කාර්ය මණ්ඩල දීමනා, අදාළ වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලට ඇතුළත් නොවේ. 2011 වර්ෂයේ දී අනුමත වූ 5% විශේෂ දීමනාව, 25% අධ්‍යයන පර්යේෂණ දීමනා ආදිය උදාහරණ වේ. එසේම අත්‍යවශ්‍ය සේවා වෙනුවෙන් දැරිය යුතු වැය වෙනුවෙන් අනුමත සීමාවන් ඉක්මවීම නොවැලැක්විය හැක්කකි.
දක්වා ඇති වැය, පුනරාවර්තන ස්වභාවයේ මූලධන වියදම් වන අතර, ඊට අදාළ ප්‍රතිපාදන පුනරුත්ථාපන හා නඩත්තු වියදම් සඳහා ප්‍රතිපාදන මුලධන ඇස්තමේන්තුවල අන්තර්ගතව ඇත. ගාස්තු අයකරනු ලබන පාඨමාලා අතුරින් ඇතැම් පාඨමාලාවන් වර්ෂයේ අපේක්ෂිත කාලවලදී ආරම්භ කිරීමට නොහැකි වීමත්, ඇතැම් පාඨමාලා එම වර්ෂය තුළදී ආරම්භ කිරීමට නොහැකිවීමත් මත එම වර්ෂයේ අපේක්ෂිත වැය අඩුවීමක් සිදුවේ.

මනා අයවැය පාලනයක් පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් දී ඇත.

## 6. පද්ධති හා පාලන.

පෙන්වා දී ඇති පද්ධති හා පාලන දුර්වලතාවයන් නිවැරදි කර ගැනීමට අවධානය යොමුකර ඇත.

**මහාචාර්ය සරත් අමුණුගම**
**උපකුලපති**